


## අපි කවුද?

## ගුවන් සේවා ආරක්ෂක (AVSEC) අභ්‍යාසලාභී පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කළමනාකරණය සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යවස්ථාපිත බලතල සහිත සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම තිරසාර ආර්ථියක් කරා යාමට ගෝලීය සම්බන්ධතාවයේ මිත්‍රශීලී ගුවන් සේවා හවුල්කරු වීමට අපේක්ෂා කරයි.

- **2025/02/23 දිනැති පෙර දැන්වීමේ අවසාන දිනය 2025/05/31 දක්වා දීර්ඝ කෙරේ.**
- **සටහන : 2025/02/23 ප්‍රසිද්ධ කරන ලද දැන්වීමට අනුව AVSEC අභ්‍යාසලාභී තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.**

උතුරු හා නැගෙනහිර පළාත් හි පදිංචි අපේක්ෂකයන් ඇතුළුව අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර, යාපනය, ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හි පුරප්පාඩු පිරවීමේදී උතුරු සහ නැගෙනහිර පළාත් අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

### වැටුප

ඉහත තනතුරු සඳහා සිත්ගන්නා සුළු වේතන පැකේජයක් පිරිනමනු ලබන අතර, තෝරාගත් අය සඳහා ආකර්ෂණීය අමතර ප්‍රතිලාභ හිමිවනු ඇත.

### වයස

- අයදුම්පත් අවසන් කරන දිනට (2025/05/31) වයස අවුරුදු 18 - 30 ත් අතර විය යුතුය.
- හිටපු හමුදා නිලධාරීන් සහ හිටපු STF නිලධාරීන් සඳහා අයදුම්පත් අවසන් කරන දිනට (2025/05/31) වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

### පොදු කරුණු

තෝරාගත් අපේක්ෂකයින් අවශ්‍ය වූ විටෙක දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සමාගමේ ඕනෑම ස්ථානයක රාජකාරී ඉටුකළ යුතුය. ඔබ මේ පිළිබඳව උනන්දුවක් දක්වන අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද හිමි අයෙක් නම් කරුණාකර, අපගේ වෙබ් අඩවිය වන www.airport.lk>corporate>careers හි දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව සකස් කරන ලද ඔබගේ ජීව දත්ත පත්‍රිකාව අදාළ සහතිකවල පිටපත් සමග 2025 මැයි 31 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ කුරියර් සේවාව මගින් පමණක් එවන්න. කරුණාකර කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති සහ / හෝ වෙනත් ආකාර මගින් ඉදිරිපත් කරන ලද සහ හෝ අපගේ වෙබ් අඩවියෙහි දක්වා ඇති ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

තෝරාගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට පමණක් දැනුම් දෙන බව කරුණාවෙන් සලකන්න.

**සභාපති,**
**සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක.**